සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/04/PM/04/E.M. Power | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.02.24 |
|---|---|---|---|---|---|

දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශිය ලේකම්වරුන්,
දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂක්ෂවරුන්,
සමෘද්ධි බැංකු/බැංකු සමිති කළමනාකරුවන්,
සමෘද්ධි බැංකු පාලක මණ්ඩල/බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,

**<u>සමෘද්ධි සහනාධාර ලබන පවුල් සඳහා, ආර්ථික සවිබල ගැන්වීමේ වැඩසටහන හඳුන්වා දීම- 2023</u>**

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය තුරන් කිරිමටත්, සමාජ සාධාරණත්වය ඇති කිරීම ප්‍රමුඛ කරගත් පරමාර්ථයෙන් ස්ථාපිත වැඩසටහන සමෘද්ධි වැඩසටහන වේ. මෙමඟින් දැනට අවු.30 කට ආසන්න කාලයක් පුරා සමෘද්ධි සහනාධාර ලබන ප්‍රතිලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් බොහො සේවා පහසුකම් සපයමින් සිටි.

එම සේවා අතරින් පහත සඳහන් සේවා ප්‍රමුඛ වී ඇත.

1. සමෘද්ධි සහනාධාර ඇතුළු ආරක්ෂණ ජාලය (Social Safety Network)
2. ක්ෂුද්‍ර මුල්‍යකරණ පහසුකම් (Micro Finance Facility)
3. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන (Live hood Development Programme)
4. සමාජ සංවර්ධන වැඩසටහන (Social Development Programme)

මෙම ප්‍රධාන වැඩසටහන් වලට සමගාමීව අලෙවි,ප්‍රජාමූල සංවිධාන, පුහුණු හා සමෘද්ධි බැංකු මහ සංගම් අංශ මගින් , ඉලක්කගත ජනතාව උදෙසා වැඩසටහන් හා ව්‍යාපෘතීන් රැසක් දැනටමත් දියත් කර ඇත.
ඉහත වැඩසටහන් හා ක්‍රියාකාරකම් මගින්,ඵලදායි ආර්ථික කාර්යයක සක්‍රිය ලෙස නියැලිය හැකි සමෘද්ධිලාභින් සහ එම පවුල්වල සාමාජිකයන්ගේ කුසලතා, හැකියාවන් සහ ඔවුන් සතු සම්පත් මත ආදායම් උත්පාදන ව්‍යාපෘතියකට යොමු කිරිමට උනන්දු කර ලදි. ඒ සඳහා සමෘද්ධි බැංකු මගින් ප්‍රාග්ධනය සඳහා ණය පහසුකම් හා දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් විවිධ මූල්‍යාධාර ,ද්‍රව්‍යාධාර , පුහුණු පහසුකම් හා වෙනත් පහසුකම් සපයන ලදි.
එහි ප්‍රතිපලයක් ලෙස, සෘජු හා වක්‍ර රැකියා ලබාදෙන, ප්‍රශස්ථ මාසික ආදායමක් උපයන, දේශිය හා විදේශිය වෙළඳපොළ සඳහා භාණ්ඩ හා සේවා සපයන, සුළු හා මධ්‍යම පරිමාණ මට්ටමට ළඟා වි ඇති ව්‍යවසායකයන් රැසක් සමෘද්ධි වැඩසටහන මගින් බිහිකරමින් සිටීම සුභවාදි ලක්ෂණයක් වේ.
එනමුත්,ඔහුන් ලබන මාසික ආදායම සමෘද්ධි සහනාධාර ලැබිමට සලකා බලන ආදායම ඉක්මවා ඇති බැවින් සහනාධාර වැඩසටහනින් ක්‍රමානුකූලව ඉවත් කිරිමට කටයුතු කිරිම සුදුසු බවත් නොයෙකුත් රුස්විම්,වැඩසටහන් වලදි යෝජනාවන් රැසක් ලැබි ඇත .

තවද, දෙපාර්තමේන්තුවේ අරමුණු හා ගලපා බැලීමේදී සහනාධාර යැපුම් මානසිකත්වයෙන් මුදවා ගෙන, දැනට හිමිකම් ලබන සමෘද්ධි සහනාධාර පත්‍රය ස්ව කැමැත්තෙන් යලිත් රජයට භාර දීම සඳහා ඔවුන්ගේ මානසිකත්වය සකස් කර. ඒ සඳහා පොළඹවා ගැනීමට අපට භාර දුර කාර්යභාරයක් සිදුකිරිමට ඇත.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

Tel- Fax - E-mail-

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
011-2872202
011-2889002
dgsamurdhi@gmail.com

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment)
011-2873799
011-2873996
diradmin@samurdhi.gov.lk
Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance)
011-2889003
011-2887469
Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office
0112872202
Hot Line: 011- 2887722

ඒ සඳහා, ආර්ථික බල ගැන්වීම් වැඩසටහනක් සකස් කර, වැඩසටහනට ඇතුලත් කරන සමෘද්ධිලාභි ව්‍යවසායකයන්ගේ ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා විශේෂ අවධානය සහ මූල්‍ය පහසුකම් තවදුරටත් සැලසීම අපේක්ෂා කරයි. ඒ අනුව, 2023 වර්ෂයට හඳුන්වා දෙන, ආර්ථික බල ගැන්වීම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව මෙම උපදෙස් නිකුත් කරන බව කාරුණිකව දන්වමි.

## 2. ආර්ථික බල ගැන්වීම් පවුල් **ඉලක්කය**

දිවයින පුරා පිහිටි සෑම ග්‍රාම නිලධාරි වසමක් පුරා මෙම බලගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක වේ. ඒ අනුව එක් එක් ග්‍රාම නිළධාරි වසමක සේවය කරන සමෘද්ධි සංවර්ධන නිළධාරියකුට, ග්‍රාම නිලධාරී වසමකටම අවම වශයෙන් පවුල් 06 බලගැන්වීමට ඉලක්කයක් හිමි වේ.
ඒ අනුව, 2023 වර්ෂයේ පවුල් 84000 ක් ආර්ථික වශයෙන් බලගැන්විමට සැලසුම් කිරිමට අපේක්ෂා කෙරේ.මෙම වැඩසටහන 2023.03.01 සිට 2023.12.31 දින දක්වා ක්‍රියාත්මක වේ.

## **3.සමෘද්ධි පවුල් තෝරා ගැනිමේදී සලකා බැලිය යුතු නිර්ණායක,**

1) රු.3500/- හෝ 4500/- වටිනාකමක් සහිත සමෘද්ධි සහනාධාරයක් ලබන ප්‍රතිලාභියකු විම.
2) අවු.05 හෝ ඊට පෙරාතුව සිට අද වන තෙක් සමාද්ධි ලාභියකු වි තිබීම.
3) දැනට මාසිකව රු.20,000/- ඊට වැඩි තිරසාර ආදායමක් ලබන ගොවියකු හෝ ව්‍යවසායකයකු විම.
4) මාසික ආදායම රු.40,000/- හෝ ඊට වැඩි අදායමක් ලබන්නෙකු බවට පත්කල හැකි අයෙකු විම.
5) අවම වශයෙන් රු.200,000/- හෝ ඊට වැඩි ණය මුදලක් සමෘද්ධි බැංකු/බැංකු සමිති මගින් ලබාගෙන නිසි පරිදි ගෙවා අවසන් / ගෙවා ගෙන යන අයෙකු වීම.
6) අවශ්‍යතාව පරිදි ඉදිරියේදී, සමෘද්ධි බැංකු ණය මුදලක් ලබාගැනීමට සුදුසුකම් ඇති / සපුරාලිය නැති බැංකු සාමාජිකයකු වීම.
7) කායික/ මානසික දුබලතාවයට පත්වූ අයකු පවුලේ නොසිටිම.
8) 2023 වර්ෂය තුලදී, සමෘද්ධි සහනාධාර පත්‍රය ආපසු භාර දීමට කැමති අයකු විම.
9) සමෘද්ධි සහනාධාර ලබන අය ව්‍යාපෘතිකරු නොවන විටක, සමෘද්ධි සහනාධාර ලාභියා බලගැන්වීමේ වැඩසටහනට ඇතුල් වීමට කැමති අයෙක් විය යුතුය.

## **5. බලගැන්වෙන පවුල් තෝරාගැනීම සහ වාර්තා කිරීම.**

4.1 සමෘද්ධි සංවර්ධන නිළධාරින් තම ප්‍රජා මූල සංවිධාන රැස්වීමක් කැඳවා , වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම සහ පවුල් තෝරාගත යුතුය. ඉන් අනතුරුව ඇමුණුම සම්පූර්ණ කර සමෘද්ධි බැංකුවට භාර දිය යුතුය.මෙම කාර්යයන් 2023.03.31 දිනය පෙර අවසන් කල යුතුය.

4.2 සමෘද්ධි බැංකුවද ඇමුණුම්-01 හි සඳහන් ආකෘතිය අනුව , තොරතුරු සකස් කර , පාලක මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කල යුතුය.

4.3 පාලක මණ්ඩල අනුමැතිය ලත් , තෝරාගත් ප්‍රතිලාභීන්ගේ තොරතුරු ( ඇමුණුම-01 හි පරිදි) dirpm123@gmail.com විද්‍යුත් ලිපිනයට E-mail හරහා සැලසුම් හා මෙහෙයුම් අංශයට 2023.04.08 ට පෙර එවිය යුතු අතර, එහි පිටපත් දිස්ත්‍රික් සමෘද්ධි අංශයට යොමු කරන ලෙසත් දන්වමි.

## **6. පහසුකම් සැලසීම.**

1) සමෘද්ධි බැංකු ණය වැඩසටහන් යටතේ ප්‍රමුඛතාවය දී ණය මුදල් ලබාදිම. එහිදි චක්‍රලේඛ උපදෙස් පරිදි රු.500,000/- ඉක්ම වු ණය ලබා දීමට පියවර ගත යුතුය.
2) දෙපාර්තමේන්තුව විසින්රාජ්‍ය ප්‍රතිපාදන මත ලබාදෙන පහසුකම්ද, මෙම පවුල් සඳහා ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම.
3) සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් සඳහා, රජය සම්බන්ධිත ආයතන සහ ස්වේච්ඡා සංවිධාන මගින් මුල්‍යාධාර/ ද්‍රව්‍යාධාර / පුහුණු කිරිම්/ වෙනත් පහසුකම් ලබා ගැනිමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම.
4) නිෂ්පාදන අලෙවි කිරීමට සහාය දැක්විම උදෙසා, අලෙවි ප්‍රදර්ශන, අලෙවි මධ්‍යස්ථාන , මාර්ග ගත වැනි අවස්ථා පිළිබඳ ප්‍රතිලාභීන් දැනුවත් කිරිම සහ යොමු කර ගැනීම.

## 7. ප්‍රගතිය සොයා බැලීම

1) ප්‍රගතිය පරික්ෂා කිරීම

| මට්ටම | කාලය | වගකීම දරන නිලධාරියා | ප්‍රගතිය වාර්තා කල යුතු අංශය |
|---|---|---|---|
| ප්‍රජා මූල සංවිධානය | මාස 01 වරක් | සමෘද්ධි සංවර්ධන නිලධාරියා(ක්ෂේත්‍ර) | සමෘද්ධි බැංකුවට |
| සමෘද්ධි බැංකුව | මාස 01 වරක් | සමෘද්ධි බැංකු කළමණාකරු | සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියට |
| සමෘද්ධි බැංකු සමිතිය | මාස 02 වරක් | සමෘද්ධි බැංකු සමිති කළමණාකරු | දිස්ත්‍රික් සමාද්ධි අංශයට |
| දිස්ත්‍රික් සමාද්ධි අංශය | මාස 03 වරක් | දිස්ත්‍රික් සමාද්ධි අධ්‍යක්ෂ | සැලසුම් හා මෙහෙයුම අංශයට |

**ප්‍රගතිය සාකච්ජා කිරිම ,දැනටමත් පවත්වන ප්‍රගති රැස්වීම් වලදීම සිදුකළ යුතුය.**

2) ග්‍රාම නිලධාරි වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් , අවම වශයෙන් මාස 01 වරක් ප්‍රතිලාභීන්ගේ ව්‍යාපෘති පුද්ගලිකව පරීක්ෂාකර, අවශ්‍ය තොරතුරු රැස්කිරීම සහා ව්‍යවසායකයින්ගේ අව්‍යශතාවයන් හඳුනා ගැනීම සිදු කල යුතුය. මෙම වැඩසටහන සඳහා තෝරාගත් ප්‍රතිලාභින් නමින් රෙජිස්තරයක් සකස් කර ලබා දුන් පහසුකම්, නිර්ක්ෂණ යෝජනාවන් පිළිබඳ ආදිය සටහන් කිරීම කළ යුතුය.

3) ප්‍රගතිය සාකච්ජා කිරීම/ පරික්ෂා කිරිමේදී පහත කරුණු පිළිබඳ සොයා බැලිය යුතුය.

I. ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය
II. මාසික ආදායමේ වර්ධනය (රු)
III. සමෘද්ධි බැංකු ණය ප්‍රදානය හා ණය ආපසු ගෙවීම.
IV. රජයේ ප්‍රතිපාදන හෝ වෙනත් ආයතන සතු අරමුදලින් මඟින් ලබාදුන් මූල්‍ය / ද්‍රව්‍ය ආධාර, පුහුණු වීම්, දැනුවත් කිරීම් ආදිය පිළිබඳ
V. වෙළඳපල ව්‍යාප්තිය(ප්‍රාදේශීය/ දේශිය/ විදේශිය)
VI. සමෘද්ධි සහනාධාර පත්‍රය ආපසු භාර දීම සහ රන් පත්‍ර ප්‍රදානය(Gold Card)
VII. සමෘද්ධි රන්පත ණය මුදාහැරීම.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. ප්‍රධාන ගණකාධිකාරී - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
2. ප්‍රධාන අභ්‍යන්තර විගණන - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස